**ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 154 ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 29 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 12 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ---------------------------------------------------- | | -------------------- | ------------- |
| මුදල් රෙගුලාසි<br>---------------- | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.2(ආ) |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම | 2.2.2 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.5 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.8 |
| | | 3. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.7 |
| | | 4. අනුකූල නොවීම් | 2.13/2.15(ඉ) |
| | | 5. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.14 |
| | | 6. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.2(ඇ) |
| | | 7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම නිසා පරිසරයට සිදු වී තිබෙන බලපෑම | 2.1.2(ඇ) |
| | | 8. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සෑකැයක් හෝ | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.3.(අ) |
| | | 2. බාහිර පාර්ශවයන් | 2.3(ආ) |

| | | | |
|---|---|---|---|
| | උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකායරක් සලසා තිබීම. | වෙත දී ඇති වත්කම්<br>3. මහජනයා සඳහා සේවා<br>4. ඉටු කිරීමේ දුර්වලතා | 2.9 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම<br>2. අයවැය ප්‍රතිපාදන රහිතව බැදීම්වලට එළඹීම | 2.1.3 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම<br>3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.10.(අ)(i)<br>2.10.(අ)(ii)<br>2.10.(අ)(iii) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය | 1. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම<br>2. පාඩු හා හානි | 2.15(ඇ)<br>2.6 |

කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 19 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 7 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයන් 19 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 16 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් 03 ක් හා ඒ සඳහා එකතුව රු.මිලියන 955 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්මේ අඩු පාඩු සහිතව පිළියෙල කිරීම නිසා කාර්යය සාධනය සැසඳීම නොහැකි වීම**

**-------------------------------------------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වැඩසටහන් 02 ක් යටතේ ක්‍රියාකරකම් 08 ක් සඳහා රු.මිලියන 145 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී ඉලක්ක ගත නිමවුම් සංඛ්‍යාව ඇතුලත් කර නොතිබුණු නිසා එම කාර්යන්වල කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඇ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**----------------------------------------**

වෙළෙඳපොල මිල ස්ථායිකරණය ඇති කිරීමට මෙන්ම පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පෞද්ගලික අංශය මඟින් කළමනාකරනය කරනු ලබන ශීතාගාර 5 ක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2,000 ක් හා 2017 වර්ෂයේ රු.මිලියන 500 ක් ලෙස ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2016 වර්ෂයේදී කිසිදු මුදලක් වැය කර නොතිබු අතර 2017 වර්ෂය තුල රු.මිලියන 53.4 ක් වැය කර ව්‍යාපෘතියේ මූලික කාර්යයන් ඉටු කළද, නිසි පරිදි ශාක්‍යතා අධ්‍යයනයක් නොකිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීමට සිදුවී තිබුණි.

**(ඈ) ව්‍යාපෘතිය නිසා පරිසරයට වන බලපෑම්**

**-----------------------------------------**

කිරි ගවයින් 20,000 ක් ආනයන ව්‍යාපෘතිය ආරම්භයට පෙර පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක්ද ලබාගෙන නොතිබුණි. තවද, මෙම සතුන් කිරි ලබාදීම වර්ෂ 5 කින් පසු ලාභදායී නොවන විට එම සතුන් ගොවිපොලින් ඉවත් කිරීම සඳහා විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමයක් මෙතෙක් හඳුන්වා දී නොතිබුණි.

**2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**-------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව දින 60 ක් ප්‍රමාද වී එනම් 2018 අගෝස්තු මස 07 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබාගැනීම

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 56.45 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 51.41 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

මෙම අදියර යටතේ පහත සඳහන් සැලැසුම් හා ලියකිවිලි පිළියෙල කර නොතිබුණි.

(i) වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම
(ii) ප්‍රසම්පාදන පැකේජ සාරාංශය
(iii) ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්ම
(iv) හඳුනාගත් ප්‍රසම්පාදනයට අදාළව පවතින විශේෂ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි
(v) පිරිවිතර, සැලැසුම්, අඳිසටහන්, නිර්මිත යනාදිය සංවර්ධනය

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු පහත ලියකියවිලි හා සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

(i) එකිනෙක කොන්ත්‍රාත් පැකේජ සහ ප්‍රසම්පාදන කාල උපලේඛනය
(ii) වැඩ, භාණ්ඩ සහ සේවා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම
(iii) උපදේශන සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම

**(ඇ) පශ්චාත් කොන්ත්‍රාත් (කොන්ත්‍රාත් පරිපාලනය) අදියරය**

මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු පහත ලියකියවිලි හා සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

(i) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම
(ii) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම සමඟ බද්ධ වූ මුදල් ගලායෑම් සැලැස්ම

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

**(අ)** අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර අවුරුදු 2 ක් සඳහා රු.197,017,920 ක ගිවිසුම් අගයක් සහිත ප්‍රසම්පාදන කටයුත්ත සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ජේද අංක 2.14.1 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් පත් කළයුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.2 ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත් කර නිර්දේශ ලබාගෙන තිබුණි.

(ii) 2015 වර්ෂයේ මිල ගණන් කැඳවීමේදී ගොඩනැගිල්ල කුලියට ලබාගැනීමට

අපේක්ෂිත කාලය දක්වා නොතිබුණු අතර ඊට පසුව අවස්ථා 03 කදී ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමෙන් තොරව මිල ගණන් ලබාගෙන තිබුණි. කුලියට ගැනීමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ ප්‍රමාණය වර්ග අඩි 35,000 ක් වුවද, වර්ග අඩි 41,460 ක ගොඩනැගිල්ල ලබාගෙන වර්ග අඩි 6,460 කට රු.30,697,920 ක් වැඩියෙන් ගෙවා තිබුණි. මෙම ගොඩනැගිල්ල ලබාගැනීමට වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබුණි. 2015 මිල ගණන් ඉදිරිපත් කර එම කොන්ත්‍රාත්කරුවන් දෙදෙනා ඉදිරිපත් කළ මිල ගණන් අඩු වුවද, ගොඩනැගිල්ල ඒ වන විට කුලියට දී තිබීම නිසා ලබාගත නොහැකි වූ අතර, එම මිල වූ රු. 2,262,337 වූ ඉදිරිපත් කළ සැපයුම්කරු නැවත මිල ගණන් කැඳවා 2016 අගෝස්තු 08 දින සිට බදු ගැනීමට එකඟවී තිබුණි. එහෙත් එම තීරණයට හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කර නැවත කමිටුවක් මඟින් මසකට කුලිය රු. 8,209,080 කට බදු ගැනීම හේතුවෙන් රු. 142,721,833 ක් වැඩියෙන් දැරීමට සිදුවී තිබුණි.

(iii) ගොඩනැගිල්ල කුලියට ගැනීමට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබාදී තිබූ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණ හා නීතිපතිවරයාගේ නිරීක්ෂණ සම්බන්ධයෙන් කටයුතු කළ බවට තොරතුරු නොතිබුණි.

(ආ) 2014 කිරිගවයින් 20,000 ක් ආනයනය සඳහා වූ නව ව්‍යාපෘති යෝජනාව යටතේ 2017 වර්ෂයේ ගවයින් 1994 ක් ආනයනය කිරීමට 2007 වර්ෂයේ ප්‍රසම්පාදනයෙන් තෝරාගත් කොන්ත්‍රාත්කරුටම ලබාදී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

#### (i) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය භාවිතා කල වාහන 47 කින් වාහන 36 ක ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

#### (ii) වාහන අවභාවිතය

2010 මැයි 14 දිනැති CA/1/17/1 දරන ජනාධිපති කාර්යාලයේ රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා වූ ලිපියේ 3 ඡේදයට පටහැනිව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන (මෝටර් රථ/ ජීප්/ඩබල්කැබ්) සංඛ්‍යාව 3 ක් ලෙස දක්වා තිබූ අතර, එම සීමාව ඉක්මවා අමාත්‍යවරයා හා නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත සංචිත වාහන 2 ක් ලබාදී තිබුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

අමාත්‍යාංශය සතු කුරුණෑගල කලාප කාර්යාල ගොඩනැගිල්ල අමාත්‍යාංශය විසින් 2017 ජූලි මස 01 දින සිට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත ලිපියක් මඟින් ලබා දීමට කටයුතු කර තිබූ නමුත් 2017 අගෝස්තු 15 දින වන විටත් විධිමත්ව පවරා දී නොතිබුණි.

## 2.4 බැදීම් හා බැරකම්

-------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

------------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 15.55 ක ප්‍රතිපාදනය රු.මිලියන .44 කින් ඉක්මවා රු.මිලියන 15.99 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

--------------------

(i) ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලේ තැන්පත් කර ඇති විශේෂ ආර්ථික මධ්‍යස්ථාන තැන්පතු රු.මිලියන 182.74 ක මුදලින් රු. මිලියන 90 ක් නඩත්තු අරමුදල හා ඉතිරි රු.මිලියන 92.74 ක පාලම් 3 ක ව්‍යාපෘති සඳහා ගෙවීමටද. 2008 දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එම නඩත්තු අරමුදලට ලබාදුන් මුදලින් භාණ්ඩාගාර බිල්පත්වල රු.61,184,435 ක් ආයෝජන කර තිබුණු අතර ආයෝජිත මුදලින් ලද පොලිය හා නඩත්තු අරමුදලේ ඉතිරි මුදල් අරමුදල පිහිටුවීමේ මූලික අරමුණෙන් බැහැරව වෙනත් කාර්යයන් සඳහා රු.75,050,025 ක් යොදවා තිබුණි. අවසානයේ 2012 දෙසැම්බර් මස 10 දිනට රු.383,600 ක් තැන්පත් කර අරමුදල නමින් ජංගම ගිණුමක් ආරම්භ කර තිබුණි.

(ii) 2012 රු.300,000 ක් තැන්පත් කර ජංගම ගිණුමක් ආරම්භ කර තිබූ අතර එය 2012 සිට 2016 දක්වා ආර්ථික මධ්‍යස්ථාන පරිශ්‍රයන් බදු දීම්වලින් එකතු කළ මුදල් එක් එක් වර්ෂවල එහි තැන්පත් කර තිබුණි. එමෙන්ම එම මුදලින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. 29,008,620 ක් ස්ථාවර තැන්පතු 10 ක හා රු. 500,000 ක් වූ නියෝග තැන්පත්වල අයෝජනය කර තිබුණි. 2012 සිට 2016 දක්වා අයෝජනය කර ස්ථාවර තැන්පතුවලට අදාළ පොලිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමේ රු. 2,434,744 ක ශේෂයක් විය. ජංගම ගිණුමේ මුදලින් රු. 5,199,885 ක් විවිධ ගෙවීම් සඳහා වැය කර තිබුණි.

## 2.6 පාඩු හා හානි

----------------

රියදුරුගේ අපරීක්ෂාකාරී ධාවනය නිසා සිදු වූ වාහන අනතුරකින් පසුව එය අළුත්වැඩියා කිරීමට රු.736,625 ක් වැයවී තිබුණු අතර රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණේ රු.608,420 ක් පමණි. ඒ අනුව රු. 128,205 ක අලාභයක් සිදු වී තිබුණු අතර එම මුදලින් ප්‍රතිශතයක් අයකර ගැනීමට වර්ෂ 1 මාස 5 කට පසු මුදල් රෙගුලාසි 104(4) අවසන් වාර්තාවට අනුව තිරණය කර තිබුණි. අයකර ගත යුතු ප්‍රතිශතය තිරණය කර නොතිබුණු අතර රියදුරු සේවයෙන් ඉවත්කර තිබූ නමුත් අයකර ගෙන තිබුණේ රු. 4,000 ක් පමණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

**විගණකාධිපති වාර්තාවට යොමුව යොමුගත විෂයය**

| වර්ෂය | ඡේද අංකය | |
|---|---|---|
| 2016 | 3.4.2(අ),(ආ) | 2017 වර්ෂයට අදාලව අමාත්‍යාංශය සතු කුරුණෑගල පිහිටි කාර්යාලය හා ඉඩම වෙනත් රාජ්‍ය ආයතන වෙත 2015 අප්‍රේල් සිට 2016 දෙසැම්බර් 31 දක්වා ලබා දී තිබු අතර තක්සේරු වාර්තා අනුව රු. 3,202,500 ක කුලී මුදලක් අමාත්‍යාංශය වෙත අයවිය යුතු වුවත්, එම බදු කුලී ආදායම 2018 ඔක්තෝබර් දක්වාම අයකර ගෙන නොතිබුණි. තවද, ගොඩනැගිලි වෙනුවෙන් අමාත්‍යාංශය වැය කර ඇති විදුලි, ජලය, ආරක්ෂක සේවා හා වරිපනම් බදු එකතුව රු. 345,301 ක මුදල අයකර ගෙන නොතිබුණි. |

## 2.8 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**කිරි ගවයින් 20,000 ක් ආනයන ව්‍යාපෘතිය ( 3වන අදියර)**

-------------------------------------------------------------------

(අ) කිරි ගවයින් 20,000 ක් ආනයනය සඳහා අනුමැතිය ලබාදීමේදී, ආනයනික සතුන් නිරෝධායනයන් සඳහා හුදෙකලා ප්‍රදේශයන් තුළ පශු වෛද්‍ය සුපරික්ෂණය යටතේ දින 30 ක් තැබීම , මෙම ආනයනික සතුන් සෘජුවම රාජ්‍ය ගොවිපල භාරයේ තබා රැක ගත් පසුව දෙවන පරම්පරාව ගොවීන් වෙත බෙදා දීම සහ යුරෝපා ජාන සහිත සතුන් ඔවුනට අනුගතකල හැකිවන පරිදි නිවැරදිව කළමනාකරණය කළ යුතු බවත් ගොවීන් වෙත සෘජුවම බෙදා දෙන්නේ නම් මහා පරිමාණ ක්‍රමවත් කළමනාකරණයක් ඇති ගොවිපල වෙත සතුන් ලබා දීම මඟින් ලාභය උපරිම කිරීම යන කරුණු වලට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කලයුතු වුවත්, එපරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොමැතිව පළමුවන පරම්පරාවේ සතුන් කුඩා ගොවිපල වෙත නිරෝධන කාලය තුළම ලබාදී තිබුණි.

(ආ) ව්‍යාපෘතිය මඟින් ආනයනික කිරි ගවයන් බෙදා දීම පිළිබඳ සිදු කළ වාරක පරීක්ෂණයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) තෝරාගත් කිරි ගොවින් 21 දෙනා අතුරින් පූර්ව පළපුරුද්ද නොමැති ගොවින් දෙදෙනෙකුට හා පූර්ව පළපුරුද්ද සහිත 3 දෙනෙකුට කිරිගවයන් ලබා දී තිබු අතර ගොවින්ගේ ණය වාරික ගෙවීම, කිරි අලෙවිය ආදි ගැටළු පිළිබඳව අමාත්‍යාංශය අවධානය යොමු කර නොතිබුණි. ගවයන් බෙදා දුන් ගොවිපළක්, ලබාදී තිබු ලිපිනයේ ස්ථාපිතව නොතිබුණි. බෙදාදුන් ගවයින් 902 න් 31 දෙනෙකු ගෙවිපළවලට ගෙන එන විටත් රෝගීව සිටි අතර රට තුළට ගෙන ඒමට පෙර පරීක්ෂාකර නොතිබිම හේතුවෙන් අනෙකුත් ගවයින්ටද, එම රෝගය පැතිරීමේ අවදානමක් තිබුණි.

(ii) කිරි ගවයින් 20000 ආනයනය යටතේ 2017 දෙසැම්බර් 27 දින කිරි ගවයින් 3024 ක් මෙරට ගෙන්වා තිබූ අතර එම කිරි ගවයින් පිළිබඳව ප්‍රධාන සත්ව නිරෝධායන නිලධාරී සහ පශු වෛද්‍ය පර්යේෂණ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කර තිබූ නිරෝධායන වාර්තාවට අනුව එම සතුන් සතු රෝග කාරක දේශීය ගවයින් වෙත සහ මනුෂ්‍යයන් වෙතද බෝවීමේ අවදානමක් ඇති බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018 පෙබරවාරි 28 දින ලිඛිතව දන්වා තිබුණි. තවද, එම වාර්තාවට අනුව නොපමාව ගත යුතු පියවරයන් නිර්ණය කර තිබූ අතර ඇතැම් සතුන් විනාශ කර දැමීමේ අවදානමක්ද අනාවරණය වී තිබුණි. නමුත් එම වාර්තාවට සහ අදාල නිර්දේශයන් පිළිබඳ අවධානය යොමු නොකොට 20,000 න් ඉතිරි සතුන් 15000 ක් ඉතා කඩිනමින් ආනයනයට පියවර ගනිමින් පැවතුණි.

(iii) 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් එළගවයන් 2500, 7,500 ක් හා 5,000 ක් ආනයනය කිරීමට ගෙවිය යුතු ඇමරිකන් ඩොලර් 55,465,541 ක මුළු මුදලින් සියයට 20 ක අත්තිකාරම් ලෙස ඇමරිකන් ඩොලර් 11,093,108 ක් එනම් රු. 1,749,672,697 ක් කොන්ත්‍රාත්කරු වෙත 2018 මැයි මස 08 දින වන විට ගෙවා තිබුණත් එම වියදම දැරීමට විසර්ජන පනතින් ප්‍රතිපාදනද නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විදේශ බැංකුවකින් ණය ලබාදී තිබුණි.

(iv) ගලේවෙල ගොවිපළකට කිරි නොමැති සතුන් 06 දෙනෙකු ලබාදී තිබූ අතර ගොවිපළ හිමියා දැනුම් දීමෙන් පසුව වෙළාඩ් ආයතනය විසින් සතුන් 10 දෙනෙකුගේ වටිනාකම වූ රු. ලක්ෂ 20 එම කිරි ගොවියාට ලබාදී තිබුණද, අමාත්‍යාංශය විසින් වැය කළ රු. 3,215,510 ක් රජයට අලාභයක් වී තිබුණි.

(v) පරීක්ෂාවේදී ගැබ් නොගත් හා ගැබ් නොගන්නා බව සඳහන් එළගවයන් 11 දෙනෙකු බෙදාදීම හේතුවෙන් ගොවින්ට රු.1,650,000 ක් හා අමාත්‍යාංශයට රු.5,606,260 ක් වශයෙන් රු. 7,256,260 ක අලාභයක් වී තිබුණි. එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) සතුන් 13 දෙනෙකු බෙදාදී මාස 06 ක් ඉක්මව තිබුණද, ගැබ් නොගත් හා ගබ්සා වූ සතුන් 13දෙනෙකු වූ අතර එක් සතෙකුට රු. 50,000 බැගින් ගෙවා තිබුණි.

(vii) කිරි ගව ව්‍යාපෘතියට සමගාමීව ආරම්භ කළ ව්‍යාපෘති 02 ක් වූ බඩ ඉරිඟු නිෂ්පාදන ව්‍යාපෘතිය හා ඇලුෆා හා ඇල්ෆා වගා ව්‍යාපෘති 2 ක අසාර්ථක වී තිබුණි. මේ හේතු නිසා ආනයනික ගවයන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට අපහසුවීම හා ලබාදෙන ආහාර වෙනුවෙන් අධික වියදම් දැරීමට සිදුවී තිබීම නිසා ණයකරුවන් බවට පත් ගොවීන්ට විදේශීය ගවයන් ඉවත් කිරීමට සිදුවී තිබුණි.

(ඈ) 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අමාත්‍යාංශය යටතේ යාත්මක වන ග්‍රාමීය පුනර්ජීවන අරමුදල, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදල (මූල්‍ය) හා ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල) 2015 සිට 2018 දක්වාම අක්‍රියව පවතුණි.

(ඈ) පිරිවැය රු. 16,300,000 ක් වාහන 6 ක් 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ වෙනත් ආයතනයකට පවරා දීමට නිර්දේශ කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඉ) 2014 නොවැම්බර් 15 දින සිදුවූ වාහන අනතුරකින් පසුව අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් හෝ මාණ්ඩලික නිලධාරි දැනුවත් නොකර නියෝජ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් මත එදිනම ගරාජය වෙත යොමුකර අලුත්වැඩියාව සඳහා රු.551,285 ක් වැය කර තිබුණි. මේ සඳහා රු. 200,000 ක් මුදලක් රක්ෂණ වන්දි ලැබුණත් අනතුර සිදුවී 2018 මැයි මස 01 දින වන විට මාස 37 ක් ඉක්මවා තිබුණද, පරීක්ෂණය සිදුකර නොතිබුණි. රියදුරු මේ වන විට සේවය අවසන් කර ඇති බැවින් රු.351,285 ක් අයකර ගැනීමට අවකාශය නොමැති බවත් දක්වා තිබුණි.

## 2.9 මහජනයා වෙත සේවා ඉටු කිරීම

කිරි ගවයින් ආනයනය කල නමුත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන නවීකරණය කිරීම, කිරි එකතු කරන මධ්‍යස්ථාන නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක නොවීම, අධීක්ෂණය කල හැකි පරිදි වැඩිදියුණු නොකිරීම, දියර කිරි සඳහා කිරි ගොවීන්හට නිසි මිලක් නොවීම, කිරි අලෙවි සැල් වැසීයාම අවම කිරීමටත් කටයුතු නොකිරීම හා කිරි අශ්‍රිත කර්මාන්ත දියුණු කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා දියර කිරි ප්‍රයෝජනයට නොගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 7,788.42 | 7,696.15 | 92.27 | 1.18 |
| | මූලධන | 10,575.75 | 4,235.36 | 6,340.39 | 59.95 |
| | **එකතුව** | **18,364.17** | **11,931.51** | **6,432.66** | **35.03** |
| 2016 | පුනරාවර්තන | 942.47 | 937.73 | 4.74 | .5 |
| | මූලධන | 9,427.96 | 7,365.25 | 2,062.72 | 22 |
| | **එකතුව** | **10,370.43** | **8,302.98** | **2,067.46** | **20** |
| 2017 | පුනරාවර්තන | 896.29 | 610.08 | 286.21 | 32 |
| | මූලධන | 9,477.31 | 7,274.00 | 2,203.31 | 23 |
| | **එකතුව** | **10,373.60** | **7,884.08** | **2,489.52** | **24** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **විසර්ජන ගිණුම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

---------------------------------------------------

වැය විෂයයන් 9 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 601. 5 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ii) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

----------------------------

වැය විෂයයන් 23 ක් සඳහා එකතුව රු.මිලියන 1,443.37 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 1,294.87 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 99.9 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iii) **පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

---------------------------------------------------------------------

වැය ශීර්ෂයකට 2017 මාර්තු 31 දින පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු. 400,000,000 ක් ප්‍රතිපාදනය කර ගෙන තිබුණද, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම වැය නොකර තිබුණි.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

----------------------------------------------

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.00 | 24.97 | 9.5 | 11.92 | 80.00 | 43.20 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

-----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.249,224 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 15ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**2.12 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| ලේඛණ වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. |
| ඇප තැන්පත් ලේඛණය | මුදල් රෙගුලාසි 880 | ඇප තැන්පත් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| බැරකම් ලේඛණය | මුදල් රෙගුලාසි 214 | අසම්පූර්ණ බැරකම් ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ. |

**2.13 නීති, රීති වලට අනුකූලව කටයුතු නොකිරීම.**

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රේගුලාසි 104 (4) | 2015 ජනවාරි 08 දින සිදුවු වාහන අනතුරකින් රු. 140,000 ක් අලුත්වැඩියා වියදමක් දරා තිබූ අතර මේ සඳහා මුදල් රේගුලාසි 104 (4) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරක් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| 2004 ජුලි 29 දිනැති පීඊඩී 25 චක්‍රලේඛය | ජංගම ගිණුමේ තැන්පත් කළ මුදලින් රු.29,508,620 ක ආයෝජනය සඳහා චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| (i) 2016 ජුලි 29 දිනැති අංක 07/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 7 වන වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර 15 ක, ස්ථාවර තැන්පතු 15 ක, ජංගම ගිණුම් 17 ක හා ඉතිරි කිරීමේ ගිණුම් 04 ක තැන්පත් කර තිබූ එකතුව රු.508,090,680 ක පිළිබඳ තොරතුරු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. |

(ii) 2006දෙසැම්බර් මස 22දිනැති අංක පී එස් 423/දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.2 (ඇ)

ඡේද අංක 4.3

ආර්ථික මධ්‍යස්ථාන නඩත්තු අරමුදලේ ගිණුම් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳව එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ ක්‍රියාකර නොතිබුණි.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල් වෙත පිටපතක් ද සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ
-------------------------
2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017

බාහිර පාර්ශව සමග එළඹෙන ලද රු.5,402,721,363 ක් වටිනා භාණ්ඩ, සේවා, සැපයුම් හා වැඩ සම්බන්ධව ගිවිසුම් හා ඇණවුම් 2018 මැයි 01 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

### 2.14.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 324.96 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.496,877 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 26 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 696 | 567 | 129 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 51 | 55 | - | 04 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 04 | 04 | - | - |
| | එකතුව | 789 | 654 | 139 | 04 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | සංවර්ධන සහකාර | 02 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලය | |
| (ii) | සංවර්ධන නිලධාරීන් | 27 | වී අලෙවි මණ්ඩලය | මාස 09 ක් කාලයක් සඳහා |
| (iii) | රියදුරු | 01 | වී අලෙවි මණ්ඩලය | වසර 05ක කාලයක් සඳහා |
| | | 01 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 2016.02.01 දින සිට |

වී අලෙවි මණ්ඩලයට මුදා හරින ලද සේවකයන් 27 දෙනෙකුගේ පිළිවෙලින් වැටුප් හා අතිකාල වශයෙන් රු.12,460,650 ක් හා රු.11,842,219 ක් අමාත්‍යාංශයෙන් ගෙවා තිබුණු අතර එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

(i) 2017 දෙසැම්බර් 31 දින වන විට කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් ගණන 39 කි.

**(ii)** පසුගිය වර්ෂ 3 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය කර තිබුණු ප්‍රමාණය සසඳා බැලීමේදී ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 45 ක පමණ පරාසයක ඉතිරියක් නිරීක්ෂණය විය.

**2.15 අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

---

**(අ) ප්‍රධාන කාර්යන්ට පටහැනිව කටයුතු කිරීම**

විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූ ගොවින්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවි කර ගැනීමට හා ඊට සම්බන්ධවන නිෂ්පාදකයින් සඳහා තොග වෙළඳුන් හා පාරිභෝගිකයන් සඳහා යටිතල පහසුකම් සැලසීම විය. එහෙත් එම අරමුණු ඉටුකර ඇත්ද, යන්න ඇගයීම් කර නොතිබුණු අතර මධ්‍යස්ථාන 05 ක වෙනත් කටයුතු පවත්වාගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) ආර්ථික මධ්‍යස්ථානවල අවසන් ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම**

කොළඹ, ගම්පහ, මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 07 ක 2017, 2016 හා 2015 වර්ෂවල පිළිවෙලින් මධ්‍යස්ථාන 07 ක්ද, 02 ක් හා 01 ක මූල්‍ය ප්‍රකාශන 2018 ජුලි 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) ආර්ථික මධ්‍යස්ථානයන්හි කඩ කාමර සඳහා කුලී අය කිරීම්**

(i) නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර සඳහා කුලී නිසි පරිදි අය කර නොගැනීම නිසා රජයට 2017 වර්ෂයේදී රු. 228,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ii) නුවරඑළිය, මීගොඩ හා රත්මලාන ආර්ථික මධ්‍යස්ථානවල පිළිවෙලින් 134 ක්, 5 ක් හා 128 ක් බදු කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ හේතුවෙන් නුවරඑළිය මධ්‍යස්ථානය 2012 වර්ෂයේ සිට ආපසු නොගෙවන හිඟ තැන්පතු පොලී රු.2,252,991 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකිව පැවතුණි.

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

නුවරඑළිය හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථානවල පිළිවෙලින් රු.4,591,048 ක් සහ රු. 107,264,848 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත්ව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**(ඉ) නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම.**

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2006 ජූලි 21 දිනැති නුවරඑළිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ අරමුදල් භාර ඔප්පුවේ 10 (ආ) ඡේදය | භාරයේ ප්‍රතිලාභ සඳහා හෝ භාරයේ නමට ලැබෙන සියලුම මුදල් භාරයේ බැංකු ගිණුමට බැර කළ යුතු වුවද, ව්‍යාපාර පරිශ්‍ර 89 කට අදාලව (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින්) අයකළ තැන්පත් මුදල් රු.73,925,000 ක් භාරයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 751 | කුරුදුවත්ත ආර්ථික මධ්‍යස්ථානයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

**(ඊ) ආර්ථික මධ්‍යස්ථාන ඉදිකර තිබූ ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම**

කොළඹ මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල, ආර්ථික මධ්‍යස්ථාන 07 කින් 05 ක් ඉදිකර තිබූ ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආර්ථික මධ්‍යස්ථානය | ඉඩමේ අයිතිය | එම ඉඩමේ මධ්‍යස්ථානය ආරම්භ කළ දිනය | අයිතිය නොමැති ආර්ථික මධ්‍යස්ථානයේ සිදුකර ඇති ඉදිකිරීම් වටිනාකම රු. |
|---|---|---|---|
| රත්මලාන | දුම්රිය දෙපාර්තමේන්තුව | 2009 | * 98,624,600 |
| මීගොඩ | දුම්රිය දෙපාර්තමේන්තුව හෝමාගම ප්‍රාදේශීය සභාව | 2003 | * 98,935,403 |
| නුවර එළිය | දුම්රිය දෙපාර්තමේන්තුව හා නුවරඑළිය මහ නගර සභාව | 2006.04.08 | 136,000.000 |
| කන්දහන්දිය | ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 2016.01.27 | 21,700,000 |
| කුරුදුවත්ත | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව | 2008.02.17 | 38,400,000 |

(උ) ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීම හේතුවෙන් රු.මිලියන 126.5 ක් වැය කර ඉදිකරණ ලද ආර්ථික මධ්‍යස්ථාන 4 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන හා පළාත් පාලන ආයතන වෙත ලබාදී තිබුණි.

(ඌ) 2013 හා 2014 වර්ෂවල ඉදිකිරීම් නිම කළ කිලිනොච්චිය හා අම්පාර ආර්ථික මධ්‍යස්ථානවල පිළිවෙලින් ව්‍යාපාර ස්ථාන 37 ක් හා 20 ක් බදු දී නොතිබුණි.

## 2.16 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන්ද, හඳුනාගෙන නොතිබුණි.